# වාර්ෂික වාර්තාව - 2024

## තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව
## ශ්‍රී ලංකාව

**කාර්යාලය**

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව
කාමර අංක 203 – 204 , ගොඩනැගිලි අංක - 2
බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය
බෞද්ධාලෝක මාවත
කොළඹ 07
ශ්‍රී ලංකාව

දුරකතන අංකය - 0112691625
[info@rtic.gov.lk](mailto:info@rtic.gov.lk)
www.rticommission.lk

## පටුන


1. හැඳින්වීම
    - 1.1 තොරතුරු වලට ප්‍රවේශවීම වීම සම්බන්ධයෙන් පුරවැසියන් සතු මූලික අයිතිවාසිකම 3
    - 1.2 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත 3
    - 1.3 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව 4
    - 1.4 කොමිෂන් සභාවේ දැක්ම 5
    - 1.5 කොමිෂන් සභාවේ මෙහෙවර 5
    - 1.6 කොමිෂන් සභාවේ අරමුණු 5

2. කොමිෂන් සභාවේ කාර්යය, කර්තව්‍ය හා බලතල
    - 2.1 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 14 වගන්තිය අනුව කොමිෂන් සභාවේ කාර්යය හා කර්තව්‍ය 6
    - 2.2 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 15 වගන්තිය අනුව කොමිෂන් සභාවේ බලතල 7
    - 2.3 වත්මන් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව 8

3. කොමිෂන් සභාවේ කාර්යය සාධනය
    - 3.1 අභියාචනා ලැබීම 9
    - 3.2 අභියාචනා විභාග කිරිම 13

4. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ දේශීය හා ජාත්‍යන්තර මැදිහත්වීම
    - 4.1 දේශීය මැදිහත්විම
        - 4.1.1 රජයේ නිළධාරීන් දැනුවත් කිරිමේ වැඩසටහන් 30
        - 4.1.2.රාජ්‍ය ආයතන සඳහා කොමිෂන් සභාව සාමාජිකයන්ගේ සම්පත් දායකත්වය 32
    - 4.2 ජාත්‍යන්තර සම්මන්ත්‍රණ 32

5. කොමිෂන් සභාවේ නෛතික කටයුතු 33

6. වාර්තා ආදිය ඉදිරිපත් කිරිමට පොදු අධිකාරිය සතු කාර්යය භාරය 46

7. පරිපාලනය හා මූල්‍ය කාර්යය සාධනය
    - 7.1 කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය 57
    - 7.2 මූල්‍ය පාලනය 58

# 1. හැඳින්වීම

2024 වර්ෂය තුළ දී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ ක්‍රියාත්මක වූ නීතිමය පසුබිම පහත පරිදි වේ.

## 1.1 තොරතුරු වලට ප්‍රවේශවීම වීම සම්බන්ධයෙන් පුරවැසියන් සතු මූලික අයිතිවාසිකම

1978 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක් කරන ලද 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් 14(අ) ලෙස නව ව්‍යවස්ථාවක් ඇතුළත් කරමින් තොරතුරු සඳහා ප්‍රවේශවීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස හඳුන්වා දෙන ලදි.

## 1.2 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත

තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ අයිතිය තහවුරු කිරීම, තොරතුරු ලබා ගැනීමේ අයිතිවාසිකම් බලාත්මක කිරීම මඟින් පොදු අධිකාරිවල විනිවිදභාවය සහ වගවීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීමේ අවශ්‍යතාව හා ශ්‍රී ලංකාවේ මහජනතාවට යහපාලනය සඳහා වැඩි වශයෙන් සහභාගීවීම සඳහා ද රටේ පොදු ජන ජීවිතයේදි තීරණ ගැනීම සඳහා සක්‍රීය ලෙස සහභාගි විය හැකි සමාජයක් ප්‍රවර්ධනය කිරීම සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම අරමුණු කරගනිමින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 2016 අංක 12 දරන තොරුතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත සම්මත කර, 2016 අගෝස්තු මස 04 දින ගරු කතානායකතුමා විසින් සහතික කරනු ලැබූ අතර 2017 පෙබරවාරි මස 03 වන දින සිට ක්‍රියාත්මක විය.

එකී පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව, 5 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව පොදු අධිකාරියක සන්තකයේ භාරයේ හෝ පාලනයේ ඇති තොරතුරුවලට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම සෑම පුරවැසියෙකුටම පවතින බවට නීතිමය ප්‍රතිපාදන සලසා ඇත.

පනතේ 43 වන වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියක් යන්න පුළුල් ලෙස පහත පරිදි අර්ථ නිරූපනය කර ඇත.

පොදු අධිකාරියක් යන්නෙන් -

- ❖ (අ) ආණ්ඩුවේ අමාත්‍යාංශයක්
- ❖ (ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ (ඉ) ඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට හැර 2007 අංක 7 දරන සමාගම් පනත හැර යම් ලිඛිත නීතියක්, හෝ පළාත් සභාවක ප්‍රඥප්තියක් මඟින් හෝ යටතේ පිහිටුවන ලද යම් මණ්ඩලයක් හෝ කාර්යාලයක්
- ❖ (ඇ) ආණ්ඩුවේ දෙපර්තමේන්තුවක්
- ❖ (ඈ) රාජ්‍ය සංස්ථාවක්

- ❖ (ඉ) සිය කොටස් වලින් සියයට විසිපහක් හෝ ඉන් වැඩි ප්‍රමාණයක් හෝ අන්‍යාකාරයකින් පාලන අයිතියක් ඇති රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ රජය සහ රාජ්‍ය සංස්ථාවක් එකතුව දරනු ලබන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක්;
- ❖ (ඊ) පළාත් පාලන ආයතනයක්|
- ❖ (උ) ආණ්ඩුව හෝ එහි නියෝජ්‍යායතනයක හෝ පළාත් පාලන ආයතනයක කොන්ත්‍රාත්තුවක්, හවුල් ව්‍යාපාරයක්, ගිවිසුමක් හෝ බලපත්‍රයක් යටතේ ව්‍යවස්ථාපිත හෝ පොදු කර්තව්‍යයක් ඉටු කරන එහෙත් ඒ ව්‍යවස්ථාපිත හෝ පොදු කර්තව්‍යයන්ගෙන් හෝ පොදු සේවාවන්ගෙන් ආවරණය වූ ක්‍රියාකාරකම් ප්‍රමාණයකට පමණක් සීමා වූ පෞද්ගලික හිමිකාරීත්වයක් හෝ සංවිධානයක්
- ❖ (ඌ) පළාත් සභාවක් විසින් පිහිටුවන ලද හෝ ඇති කරන ලද යම් දෙපාර්තමේන්තුවක් හෝ වෙනත් අධිකාරියක් හෝ ආයතනයක්
- ❖ (එ) මහජනතාව වෙත සේවයක් ලබා දෙනු ලබන සහ ඉල්ලා සිටින ලද තොරතුරු මහජනතාව වෙත ලබා දෙනු ලබන සේවයට අදාළ වනතාක් දුරට ආණ්ඩුව හෝ යම් දෙපාර්තමේන්තුවක් හෝ පළාත් සභාවක් මගින් පිහිටුවන ලද හෝ ඇති කරන ලද වෙනත් අධිකාරියක් හෝ විදේශීය ආණ්ඩුවක් හෝ ජාත්‍යයන්තර සංවිධානයක් මගින් සැලකිය යුතු ප්‍රමාණයේ අරමුදල් සපයනු ලබන රාජ්‍ය නොවන සංවිධාන
- ❖ (ඒ) යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලබන" හඳුනාගනු ලබන හෝ බලපත්‍රයක් ලබා දෙනු ලබන හෝ රජය මගින් හෝ රාජ්‍ය සංස්ථාවක් මගින් හෝ පළාත් සභා ප්‍රඥප්තියක් යටතේ පිහිටුවනු ලබන හා ඇති කරනු ලබන යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් මගින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් මූල්‍යාධාර සපයන පෞද්ගලික විශ්වවිද්‍යාල සහ වෘත්තීය ආයතන ඇතුළු උසස් අධ්‍යාපන ආයතන
- ❖ (ඔ) යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලබන" පිළිගනු ලබන හෝ බලපත්‍රයක් ලබා දෙනු ලබන හෝ රජය මගින් හෝ රාජ්‍ය සංස්ථාවක් මගින් හෝ පළාත් සභා ප්‍රඥප්තියක් යටතේ පිහිටුවනු ලබන හා ඇති කරනු ලබන යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් මගින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් මූල්‍යාධාර සපයන වෘත්තීය හෝ කාර්මික අධ්‍යාපනය ලබා දෙන ආයතන ඇතුළු පුද්ගලික අධ්‍යාපන ආයතන
- ❖ (ඕ) යුක්තිය පසිඳලීම සඳහා ඇති කොට පිහිටුවන ලද අධිකරණ, විනිශ්චය අධිකරණ හා ආයතන,

## 1.3 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 11 වගන්තිය ප්‍රකාරව ස්ථාපිත කර ඇත. එය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයකි.

ඒ අනුව 2016 ඔක්තෝබර් 01 වන දින ප්‍රථම වරට කොමිෂන් සභාව සඳහා සාමාජිකයන් පත් කරන ලදී. පොදු අධිකාරීන් වෙත පවරා ඇති කාර්යය නිසි පරිදි ඉටු කරන්නේද යන්න අධික්ෂණය කිරීමට සහ පනතේ 38 වන වගන්තිය ප්‍රකාරව, පනතේ විධිවිධාන උල්ලංඝනය කරන්නන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට ද කොමිෂන් සභාවට බලය ඇත. තවද පනතේ 39 (1)(ඉ) වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ තීරණයකට අනුකූලවීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන ලද පුද්ගලයන්ට එරෙහිව අපරාධ නඩු පැවරීමේ බලයද කොමිෂන් සභාවට ඇත

එමෙන්ම කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු ආකෘතිය හා ආකාරය, පරීක්ෂණයක් පැවැත්වීමේදි අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය හා තොරතුරු සැපයුම සම්බන්ධයෙන් වූ ගාස්තු පිළිබඳ රීති සකස් කිරීමේ බලයද කොමිෂන් සභාව සතු වේ. ඒ අනුව ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමජවාදි ජනරජයේ අංක 2004/66 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2017 පෙබරවාරි 03 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගාස්තු හා අභියාචනා කාය්‍ය පටිපාටිය සම්බන්ධයෙන් රීති මාලාවක් හඳුන්වා දී ඇත.

## 1.4 කොමිෂන් සභාවේ දැක්ම

ශ්‍රී ලාංකේය පුරවැසියන්ට ඔවුන්ගේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම ඵලදායි ලෙස ක්‍රියාත්මක කරගත හැකි බව සාක්ෂාත් කිරීම.

## 1.5 කොමිෂන් සභාවේ මෙහෙවර

සියලු ශ්‍රී ලාංකේය පුරවැසියන්ගේ තොරතුරු දැනගැනීමේ අයිතිය සංවර්ධනය කරමින් සහ සුරක්ෂණය කරමින්, ඵලදායි විනිශ්චය කිරීම් සහ සියලු පොදු අධිකාරීන්ගේ භාවිතාවන් අධීක්ෂණය හරහා විනිවිදභාවයේ සහ යහපාලනයේ සංස්කෘතියක් අනුදකිමින් තමන්ට අදාළ සියලු තොරතුරු පිළිබඳ පුරවැසියන් වඩාත් සාවධානී කිරීමට මඟපෙන්වමින් ප්‍රගාමී ලෙස හෙළිදරව් කිරීම ප්‍රවර්ධනය කිරීම.

## 1.6 කොමිෂන් සභාවේ අරමුණු

❖ වඩා ඵලදායි විනිශ්චයන් සැපයීම සහ ඒවා බලාත්මක කිරීම: පොදු අධිකාරීන් සහ තොරතුරු ඉල්ලුම්කරුවන් අතර ඇතිවන ගැටුම් ඵලදායී ලෙස විනිශ්චය කිරීම.

❖ රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම සඳහා සහාය දැක්වීම: රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීමේදී සහයෝගයෙන් කටයුතු කිරීම, උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ තොරතුරු දැනැගනීමේ අයිතිවාසිකම පිළිබඳ විශේෂිත පුහුණුව සඳහා සහාය දැක්වීම.

❖ මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම: කොමිෂන් සභා වෙබ් අඩවිය සහ මාධ්‍ය අන්තර්ක්‍රියා හරහා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධයෙන් මහජනතාවගේ අවබෝධය ඉහළ නැංවීම.

- ❖ වාර්තා කළමනාකරණය වැඩිදියුණු කිරීම: මාර්ගෝපදේශන ලබාදීම මඟින්, තොරතුරු කළමනාකරණය සම්බන්ධයෙන් නිශ්චිත උපදෙස් ලබා දීම.
- ❖ ප්‍රගාමී ලෙස හෙළිදරව් කිරීම ඉහළ නැංවීම: මාර්ගෝපදේශ නිකුත් කිරීම, අවම ප්‍රමිතීන් දැක්වීම, දැනට පවත්නා නීතිවල සංශෝධනවලට මුලපිරීම සහ කාලාන්තරික ඇගයීම් සිදුකිරීම.
- ❖ ඵලදායී අධීක්ෂණ සහ ඇගයුම් පද්ධතියක් ස්ථාපිත කිරීම: උචිත ඔන්ලයින් විසඳුම් සහ ඇගැයීම් මෙවලම් උපයෝගීකර ගැනීම හරහා, පොදු අධිකාරීන් විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාවට නංවන ආකාරය ඵලදායී ලෙස අධීක්ෂණය සහ ඇගයීම.

# 2. කොමිෂන් සභාවේ කාර්යය, කර්තව්‍ය හා බලතල

## 2.1 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 14 වගන්තිය අනුව කොමිෂන් සභාවේ කාර්යය හා කර්තව්‍ය

- ❖ මෙම පනත යටතේ පොදු අධිකාරීන් වෙත කායීය නිසි පරිදි ඉටු කරන්නේ ද යන්න අධීක්ෂණය කිරිම සහ ඒවාට අනුකූලව කටයුතු කරන්නේද යන්න සහතික වීම.
- ❖ ප්‍රතිසංස්කරණය සමාලෝචනය කිරිම සඳහා අවශ්‍ය පොදු නිර්දේශ ස්වභාවයකින් යුක්ත වූ සහ විශේෂයෙන්ම යම් පොදු අධිකාරියක් වෙත යොමු කරන ලද යන දෙවර්ගයේම නිර්දේශ සෑදිම
- ❖ මෙම පනත යටතේ යම් තොරතුරක් නිදහස් කරනු ලැබීම පිණිස පොදු අධිකාරිය විසින් අය කරනු ලබන ගාස්තු නිශ්චය කිරිම සඳහා සාධාරණත්වය පදනම් කොට ගෙන මාර්ගෝපදේශ නිකුත් කිරිම
- ❖ තොරතුරු නිළධාරියෙකු විසින් ගාස්තුවක් අයකිරිමෙන් තොරව තොරුතුරු ලබාදිය හැක්කේ කවර අවස්ථාවලදී ද යන්න නියම කිරිම
- ❖ තොරතුරු සැපයීම සම්බන්ධයෙන් ප්‍රගාමී හෙළිදරව් කිරිමේ ප්‍රතිපත්තිය මත පදනම්ව ගාස්තු උපලේඛණ නියම කිරිම
- ❖ මෙම පනතේ විධිවිධාන ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් රාජ්‍ය නිළධාරින් සමඟ සාමූහිකව කටයුතු කිරිම හෝ එම නිළධාරින් සඳහා පුහුණු කටයුතු භාරගැනීම
- ❖ මෙම පනතේ අවශ්‍යතා සහ ඒ යටතේ පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ප්‍රසිද්ධ කිරිම
- ❖ පොදු අධිකාරින් සඳහා වාර්තා නිසි පරිදි පවත්වා ගැනීමේ මාර්ගෝපදේශ නිකුත් කිරීම

## 2.2 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 15 වගන්තිය අනුව කොමිෂන් සභාවේ බලතල

- ❖ පරීක්ෂණයක් පැවැත්විම සහ එම පරීක්ෂණය සඳහා පෙනී සිටින ලෙස යම් තැනැත්තේකුට නියම කිරිම

- ❖ දිවුරුම් දීම හෝ ප්‍රතිඥා දීම යටතේ එම තැනැත්තා විභාග කිරිම හා අවශ්‍ය අවස්ථාවල දී එම තැනැත්තාගේ සන්තකයේ පවතින යම් තොරතුරක් සපයන ලෙස එම තැනැත්තා වෙත නියම කිරිම, එසේ වුවද 5 වන වගන්තිය යටතේ හෙළිදරව් කිරිම මුක්ත කර ඇති තොරතුරු රහසිගතව පරික්ෂා කළ යුතුය

❖ මෙම පනතේ විධිවිධාන යටතේ වූ යම් පොදු අධිකාරියක් විසින් ප්‍රතික්ෂේප කරුනු ලබන තොරතුරු ඇතුළු පොදු අධිකාරීන් විසින් දරනු ලබන තොරතුරු පරික්ෂා කිරීම

❖ යම් නිශ්චිත ආකෘතියකින් තොරතුරු සපයන ලෙස පොදු අධිකාරියක් වෙත විධාන කිරීම

❖ 5 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මහජනතාවගෙන් යම් පොදු අධිකාරියක් රඳවාගෙන සිටිනු ලබන තොරතුරු ප්‍රසිද්ධ කරන ලෙස එම පොදු අධිකාරිය වෙත විධාන කිරීම

❖ 32 වන වගන්තිය යටතේ අතෘප්තියට පත් යම් තැනැත්තෙකු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා විභාග කිරීම සහ තීරණය කිරීම සහ ඉල්ලා සිටිනු ලැබූ තොරතුරු නියමිත වේලාවට නොලැබීම හේතුවෙන් පුරවැසියකුගෙන් අය කරනු ලැබූ ගාස්තු ප්‍රතිපූර්ණය කරන ලෙස පොදු අධිකාරියක් හෝ අදාළ තොරතුරු සැපයීමේ නිළධාරියෙකු වෙත නියෝග කිරීම

## 2.3 වත්මන් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

පනතේ 12(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් පස්දෙනෙකුගෙන් සමන්විත විය යුතුය. එම නිර්දේශ ඉදිරිපත් කිරීමේදී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායක සභාව විසින් පහත සඳහන් එක් එක් සංවිධාන හෝ සංවිධාන ප්‍රභේද විසින් නම් කරනු ලබන එක් තැනැත්තකු නිර්දේශ කරනු ලැබිය යුතුය.

(අ) නීතිඥවරයන් සහ නීති ක්ෂේත්‍රයේ විද්වත් ප්‍රජාව විමසා නීතිඥ වෘත්තියේ ප්‍රවීණත්වයක් ඇති නීතිඥයවරයෙක් හෝ නීති විශාරදයෙක් නම් කළ යුතු ශ්‍රී ලංකා නීතිඥ සංගමය
(ආ) ප්‍රකාශකවරුන්ගේ, කර්තෘවරුන්ගේ සහ මාධ්‍යවේදීන්ගේ සංවිධාන; සහ

(ඇ) වෙනත් සිවිල් සමාජ සංවිධාන.

පනත සම්මත වීමෙන් පසු 2016.10.01 දින ප්‍රථම වරට පත් කරනු ලැබූ කොමිෂන් සභාවේ සභාපති ඇතුලු කොමසාරිස්වරුන්ගේ ප්‍රථම වසරක 05 ක ධූර කාලය 2021.09.21 දිනෙන් අවසන් විය.

2021.12.09 දින සිට ක්‍රියාත්මක වන වත්මන් කොමිෂන් සභාවේ සභාපති ලෙස විශ්‍රාමික විනිසුරු උපාලි අබේරත්න මහතා හා කොමසාරිස්වරු ලෙස විශ්‍රාමික විනිසුරු රෝහිණී වල්ගම මහත්මිය, නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන මෙය හා නිතිඥ ජගත් ලියනආරච්චි මහතා ද 2022.09.20 දින සිට පත් වූ මොහොමඩ් නහියා මහතා ද කටයුතු කරනු ලබයි. 2023.04.06 දින සිට කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස ඩී. සී දිසානායක මහතා කටයුතු කරනු ලබයි.

# 3. කොමිෂන් සභාවේ කාර්යය සාධනය

## 3.1 අභියාචනා ලැබීම

පනතේ 32 වන වගන්ති ප්‍රකාරව, 31(1) වගන්තිය යටතේ වන අභියාචනයක් සම්බන්ධයෙන් කරන ලද තීරණයෙන් අගතියට පත් යම් තැනැත්තකු විසින් හෝ 31(3) වගන්තිය නිශ්චිතව දක්වා ඇති කාලය ඇතුළත තීරණයක් ලබා දිය යුතු යම් අභියාචනාවකට තීරණය ලබා ගැනීමට නොහැකි වීමෙන් අගතියට පත් යම් තැනැත්තකු විසින්, එසේ නිශ්චිතව දක්වා ඇති කාලය ඉකුත් වීමෙන් මාස දෙකක් ඇතුළත දී කොමිෂන් සභාව වෙත අභියාචනා කරනු ලැබිය හැකිය.

ඒ අනුව 2024 වන වර්ෂය තුලදී කොමිෂන් සභාව වෙත අභියාචනා 1852 ක් ලද අතර එය පූර්ව වර්ෂයේ කොමිෂන් සභාව වෙත ලද අභියාචනාවලට වඩා අභියාචනා 164 කින් වැඩි වී ඇත. 2018 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා පළාත් හා දිස්ත්‍රික්ක අනුව කොමිෂන් සභාව වෙත ලද අභියාචනා පහත පරිදි දැක්වේ. 2024 වසරේ මුළු අභියාචනා ප්‍රමාණයෙන් 1848ක් ශ්‍රී ලංකාවේ ලිපින සහිතව පුරවැසියන් විසින් යොමු කර ඇති අතර අනෙකුත් අභියාචනා 4ක් ශ්‍රී ලංකාවේ ලිපින රහිතව විදේශ ලිපිනයන්ගෙන් ශ්‍රී ලාංකික පුරවැසියන් විසින් යොමු කර ඇති අභියාචනා වේ. එබැවින් එම අභියාචනා 4 පළාත් සහ දිස්ත්‍රික්ක අනුව කරන ලද වර්ගීකරණයට ඇතුලත් නොකරන ලදි

**වගුව 1 - පළාත අනුව අභියාචනා වර්ගීකරණය**

| අංක | පළාත / වර්ෂය | 2018 | 2019 | 2020 | 2021 | 2022 | **2023** | **2024** |
|---|---|---|---|---|---|---|---|---|
| 1. | උතුර | 48 | 69 | 71 | 82 | 116 | **181** | **197** |
| 2. | වයඹ | 26 | 77 | 34 | 21 | 73 | **99** | **122** |
| 3. | බස්නාහිර | 338 | 443 | 226 | 239 | 446 | **646** | **646** |
| 4. | උතුරු මැද | 43 | 30 | 16 | 21 | 60 | **74** | **58** |
| 5. | මධ්‍යම | 77 | 74 | 83 | 80 | 215 | **175** | **214** |
| 6. | සබරගමුව | 35 | 64 | 30 | 63 | 67 | **95** | **85** |
| 7. | නැගෙනහිර | 75 | 113 | 112 | 30 | 168 | **150** | **197** |
| 8. | දකුණ | 143 | 188 | 145 | 268 | 352 | **225** | **296** |
| 9. | ඌව | 15 | 31 | 12 | 21 | 28 | **43** | **33** |
| 10. | විදේශීය | | | | | | | **04** |
| | එකතුව | 800 | 1089 | 729 | 825 | 1525 | **1688** | **1852** |

**වගුව 2 - දිස්ත්‍රික්ක අනුව අභියාචනා වර්ගීකරණය**

| අංක | දිස්ත්‍රික්කය / වර්ෂය | 2018 | 2019 | 2020 | 2021 | 2022 | **2023** | **2024** |
|---|---|---|---|---|---|---|---|---|
| 1. | කොළඹ | 212 | 323 | 161 | 197 | 342 | **454** | **447** |
| 2. | ගම්පහ | 91 | 73 | 52 | 30 | 71 | **136** | **109** |
| 3. | කලුතර | 35 | 47 | 13 | 12 | 33 | **56** | **91** |
| 4. | ගාල්ල | 90 | 113 | 58 | 47 | 96 | **134** | **110** |
| 5. | මාතර | 21 | 44 | 29 | 14 | 59 | **48** | **102** |
| 6. | හම්බන්තොට | 32 | 31 | 58 | 207 | 197 | **43** | **74** |
| 7. | මහනුවර | 63 | 49 | 54 | 67 | 104 | **117** | **141** |
| 8. | මාතලේ | 13 | 12 | 3 | 6 | 13 | **22** | **42** |
| 9. | නුවර එළිය | 2 | 13 | 26 | 9 | 98 | **36** | **38** |
| 10. | ත්‍රිකුණාමලය | 6 | 12 | 5 | 17 | 16 | **27** | **58** |
| 11. | මඩකලපුව | 7 | 25 | 12 | 12 | 12 | **24** | **29** |
| 12. | අම්පාර | 61 | 76 | 95 | 51 | 140 | **99** | **113** |
| 13. | යාපනය | 26 | 49 | 44 | 41 | 62 | **77** | **120** |
| 14. | වව්නියාව | 15 | 10 | 6 | 4 | 19 | **38** | **18** |
| 15. | මන්නාරම | 5 | 2 | 3 | 5 | 9 | **16** | **34** |
| 16. | කිලිනොච්චිය | 1 | 5 | 1 | 3 | 10 | **18** | **15** |
| 17. | මුලතිව් | 1 | 3 | 17 | 10 | 16 | **32** | **9** |
| 18. | කුරුණෑගල | 19 | 54 | 18 | 10 | 41 | **40** | **50** |
| 19. | පුත්තලම | 7 | 23 | 16 | 11 | 32 | **59** | **68** |
| 20. | අනුරාධපුරය | 35 | 14 | 11 | 14 | 32 | **30** | **36** |
| 21. | පොලොන්නරුව | 7 | 16 | 5 | 7 | 28 | **44** | **27** |
| 22. | කෑගල්ල | 6 | 20 | 9 | 3 | 17 | **20** | **24** |
| 23. | රත්පුරය | 29 | 44 | 21 | 27 | 50 | **75** | **61** |
| 24. | බදුල්ල | 6 | 19 | 9 | 3 | 15 | **26** | **17** |
| 25. | මොනරාගල | 10 | 12 | 3 | 18 | 13 | **17** | **15** |
| 26. | විදේශීය | | | | | | | **04** |
| | එකතුව | 800 | 1089 | 729 | 825 | 1525 | **1688** | **1852** |

2018 සිට 2024 දක්වා කොමිෂන් සභාව වෙත ලද අභියාචනා පිළිබඳ සැලකිමේදී සෑම වර්ෂයකම මෙන්ම වැඩි අභියාචනා ගණනක් ලැබී ඇත්තේ බස්නාහිර පළාතෙනි. බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක අතුරින් සෑම වර්ෂයකම කොළඹ දිස්ත්‍රික්කයෙන් යොමුවන අභියාචනා ඉහළ අගයක් ගෙන ඇත.

තවද 2023 වර්ෂයේ සැසඳීමේදී 2024 වර්ෂයේ සමස්ත අභියාචනා වර්ධනය 9.42% කි.

වගුව 3 - 2024 වර්ෂයේ තොරතුරු මූලාශ්‍රය අනුව අභියාචනා වර්ගීකරණය

| අංක | තොරතුරු මූලාශ්‍රය | අභියාචනා සංඛ්‍යාව |
|---|---|---|
| 1. | මානව සම්පත් කළමනාකරණය | 379 |
| 2. | ඉඩම් හා දේපල | 242 |
| 3. | පරිපාලන සේවා කටයුතු | 174 |
| 4. | මූල්‍ය කළමනාකරණ සහ ගිණුම් | 145 |
| 5. | යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති | 71 |
| 6. | අධ්‍යාපන සේවය | 36 |
| 7. | පාරිසරික බලපෑම් | 02 |
| 8. | විභාග, විමර්ෂණ කමිටු වාර්තා | 165 |
| 9. | සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධ කරුණු | 19 |
| 10. | නිතිය හා සාමය | 58 |
| 11. | ප්‍රසම්පාදන | 04 |
| 12. | පොදු කරුණු | 00 |
| 13. | විවිධ තොරතුරු ඉල්ලීම් | 557 |
| | මුළු ගණන | 1852 |

වගුව 4 – 2024 වර්ෂයේ පොදු අධිකාරීන් අනුව අභියාචනා වර්ගීකරණය

කොමිෂන් සභාව වෙත 2024 වර්ෂය තුළ ලැබී ඇති අභියාචනා අතරින් පොදු අධිකාරිය කුමක්ද යන්න නිවැරදිව සඳහන් නොකරමින් කරන ලද අභියාචනා 8ක් ඇතුලත්ව ඇත. එමෙන්ම පනතේ 43 වගන්තිය යටතේ පොදු අධිකාරිය යන අර්ථ නිරූපණයට අයත් නොවන ආයතන පොදු අධිකාරි ලෙස සඳහන් කරමින් කරන ලද අභියාචනා 11ක් ද ඇතුලත් විය. එවන් අවස්ථාවලදී අදාළ ආයතනය පොදු අධිකාරියක් වන බවට තහවුරු කිරීමේ වගකීම අභියාවක සතුවේ. ඒ අනුව මෙම අභියාචනා 19 පොදු අධිකාරීන් අනුව කරන ලබන වර්ගීකරණයට ඇතුලත් නොකරන ලදි.

| අංක | පොදු අධිකාරිය | අභියාචනා සංඛ්‍යාව |
|---|---|---|
| (අ) | ආණ්ඩුවේ අමාත්‍යාංශ | 245 |
| (ආ) | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ (ඉ) ඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට හැර 2007 අංක 7 දරණ සමාගම් පනත හැර යම් ලිඛිත නිතියක් හෝ පළාත් සභාවක ප්‍රඥාප්තියක් මගින් හෝ යටතේ පිහිටුවන ලද යම් මණ්ඩල හෝ කාර්යාල | 636 |
| (ඇ) | ආණ්ඩුවේ දෙපාර්තමේන්තු | 364 |
| (ඈ) | රාජ්‍ය සංස්ථා | 60 |
| (ඉ) | සිය කොටස්වලින් 25% ක් හෝ ඉන් වැඩි ප්‍රමාණයක් හෝ අනන්‍යාකාරයකින් පාලන අයිතියක් ඇති රාජ්‍ය හෝ රාජ්‍ය සංස්ථාවක් එකතුව දරනු ලබන 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගම් | 04 |
| (ඊ) | පළාත් පාලන ආයතන | 165 |

| අංක | පොදු අධිකාරිය | අභියාචනා සංඛ්‍යාව |
|---|---|---|
| (උ) | ආණ්ඩුව හෝ එහි නියෝජ්‍යායතනයක හෝ පළාත් පාලන ආයතයක කොන්ත්‍රාත්තුවක්, හවුල් ව්‍යාපාරයක්, ගිවිසුමක්, බලපත්‍රයක් යටතේ ව්‍යවස්ථාපිත හෝ පොදු කර්තව්‍යයන්ගෙන් හෝ පොදු සේවාවන්ගෙන් ආවරණය වූ ක්‍රියාකාරකම් ප්‍රමාණයකට පමණක් සිමාවූ පෞද්ගලික හිමිකාරිත්වයක් හෝ සංවිධාන | 66 |
| (ඌ) | පළාත් සභාවක් විසින් පිහිටුවන ලද හෝ ඇති කරන ලද යම් දෙපාර්තමේන්තුවක් හෝ වෙනත් අධිකාරියක් හෝ ආයතන | 214 |
| (එ) | මහජනතාව වෙත සේවයක් ලබාදෙනු ලබන සහ ඉල්ලා සිටින ලද තොරතුරු මහජනතාව වෙත ලබාදෙනු ලබන සේවයට අදාළ වනතාක් දුරට ආණ්ඩුව හෝ යම් දෙපාර්තමේන්තුවක් හෝ පළාත් සභාවක් මගින් පිහිටුවන ලද හෝ ඇතිකරන ලද වෙනත් අධිකාරියක් හෝ විදේශීය ආණ්ඩුවක් හෝ ජාත්‍යන්තර සංවිධානයක් මගින් සැලකිය යුතු ප්‍රමාණයක් අරමුදල් සපයනු ලබන රාජ්‍ය නොවන සංවිධාන | 14 |
| (ඒ) | යම් ලිඛිත නිතියක් යටතේ පිහිටුවනු ලබන, හඳුනාගනු ලබන හෝ බලපත්‍රයක් ලබාදෙනු ලබන හෝ රජය මගින් හෝ රාජ්‍ය සංස්ථාවක් මගින් හෝ පළත් සභා ප්‍රඥප්තියක් යටතේ පිහිටුවනු ලබන හා ඇතිකරනු ලබන යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් මගින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් මුල්‍යාධාර සපයන පෞද්ගලික විශ්ව විද්‍යාල සහ වෘත්තීය ආයතන ඇතුළු උසස් අධ්‍යාපන ආයතන | 57 |
| (ඔ) | යම් ලිඛිත නිතියක් යටතේ පිහිටුවනු ලබන, පිළිගනු ලබන හෝ බලපත්‍රයක් ලබාදෙනු ලබන හෝ රජය මගින් රාජ්‍ය සංස්ථාවක් මගින් හෝ පළාත් සභා ප්‍රඥප්තියක් යටතේ පිහිටුවනු ලබන හා ඇති කරනු ලබන යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් මගින් පූර්ණ වශයෙන් හේ අර්ධ වශයෙන් මුල්‍යාධාර සපයන වෘත්තීය හෝ කාර්මික අධ්‍යාපනය ලබාදෙන ආයතන ඇතුළු පුද්ගලික අධ්‍යාපන ආයතන | 08 |
| (ඕ) | යුක්තිය පසඳලීම සඳහා ඇති කොට පිහිටුවන ලද අධිකරණ, විනිශ්චය අධිකරණ හා ආයතන | 00 |
| | වර්ගීකරණය නොවූ | 19 |
| | එකතුව | 1852 |

වගුව 5 –

**2024 වර්ෂයේ භාෂාව අනුව ලද අභියාචනා**

| භාෂාව | අභියාචනා සංඛ්‍යාව |
|---|---|
| සිංහල | 1252 |
| දෙමළ | 270 |
| ඉංග්‍රීසි | 331 |
| එකතුව | 1852 |

## 3.2 අභියාචනා විභාග කිරීම

2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කොමිෂන් සභාව වෙත අභියාචනා 1852 ක් ලැබුණි. 2023 වර්ෂයේ ලැබුණු අභියාචනා අතුරින් අභියාචනා 466 ක් එම වර්ෂය තුළ විභාග කර අවසන් කිරීමට නොහැකිවූ බැවින් 2024 වර්ෂයේදි විභාග කිරීම සඳහා ඇතුළත් කෙරුණි. ඒ අනුව 2024 වර්ෂයේදී විභාග කිරිමට නියමිත වූ මුළු අභියාචනා සංඛ්‍යාව 2382ක් විය. මේ අතරින් අභියාචනා 1504ක් විභාග කර අවසන් කර ඇති අතර කොමිෂන් සභාව විසින් හඳුනාගනු ලැබූ ඌණතා සහිත අභියාචනා සංඛ්‍යාව 384 ක් විය. එමෙන්ම අඩක් විභාගකර ඉදිරි වර්ෂයට දින නියම කරන ලද අභියාචනා 112 ක් ද බහාතබන ලද අභියාචනා 01 ක් 2024 වර්ෂයේ විභාගයට ගැනීමට නොහැකිව 2025 වර්ෂයේ විභාග සඳහා දින නියමකළ අභියාචනා 381 ක් වශයෙන් උක්ත සම්පූර්ණ අභියාචනා සංඛ්‍යාව සමන්විත විය.

තවද 2024 වර්ෂයට පෙර සිට විභාග කරගෙන පැවති අභියාචනා සහ ඌණතා සහිත අභියාචනා සඳහා නිකුත් කරන ලද නියෝගද ඇතුළත්ව 2024 වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් අවසන් නියෝග නිකුත් කරනු ලැබූ අභියාචනා සංඛ්‍යාව 1837 විය.

**වගුව 6- 2024 වර්ෂයේ අභියාචනා විභාග කිරිම (2024.01.01 දින සිට 2024.12.31 දක්වා)**

<table>
<tr><th>ලැබූ අභියාචනා</th><th>සංඛ්‍යාව</th><th>විභාගකල අභියාචනා</th><th>සංඛ්‍යාව</th></tr>
<tr><td>පෙර වර්ෂයෙන් පරීක්ෂණ සඳහා ලැබී ඇති අභියාචනා සංඛ්‍යාව</td><td>466</td><td rowspan="2">2024 වසරේ විභාග කර අවසන් කර ඇති මුළු අභියාචනා සංඛ්‍යාව (ඌණතා සම්පූර්ණ කර විභාගය සඳහා නියම කරන ලද අභියාචනා සංඛ්‍යාවද ඇතුළුව)</td><td rowspan="2">1504</td></tr>
<tr><td>2023 වර්ෂයේ අඩක් අසා නැවත විභාග කිරිම සඳහා දින නිකුත් කරන ලද අභියාචනා සංඛ්‍යාව</td><td>64</td></tr>
<tr><td rowspan="4">2024 වර්ෂයේ කොමිෂන් සභාව වෙත ලැබුණු මුළු අභියාචනා සංඛ්‍යාව</td><td rowspan="4">1852</td><td>කොමිෂන් සභාව විසින් හඳුනාගනු ලැබූ ඌණතා සහිත අභියාචනා / පැමිණිලි සංඛ්‍යාව</td><td>384</td></tr>
<tr><td>අඩක් අසා නැවත විභාග කිරිම සඳහා දින නිකුත් කරන ලද අභියාචනා සංඛ්‍යාව</td><td>112</td></tr>
<tr><td>බහාතබන ලද අභියාචනා සංඛ්‍යව</td><td>01</td></tr>
<tr><td>2025 වර්ෂයේ ඉදිරියට ගෙන ගිය අභියාචනා සංඛ්‍යාව</td><td>381</td></tr>
<tr><td>මුළු අභියාචනා සංඛ්‍යාව</td><td>2382</td><td>මුළු අභියාචනා සංඛ්‍යාව</td><td>2382</td></tr>
<tr><td colspan="3">2024 වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් විභාග කොට අවසන් නියෝග නිකුත් කරන ලද මුළු අභියාචනා සංඛ්‍යාව (ඌණතා සහිත අභියාචනා සඳහා නිකුත් කරන ලද නියෝග ද ඇතුළුව)</td><td>1837</td></tr>
</table>

2017.02.03 දින පළකරන ලද අංක 2004/66 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ "තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභා රීති 2017" යන මැයෙන් පළකරන ලද රීතීන්හි අංක 20 දරණ රීතියෙහි ඇතුළත් කාර්‍ය පටිපාටියට අනුකූලව සියලුම අභියාචනා 2024 වර්ෂය තුල පුද්ගලික වශයෙන් විභාග කරන ලදී. මෙම ක්‍රියාවලියේදී රීති අංක 22 ප්‍රකාරව පුද්ගලික වශයෙන් හෝ ඔහුගේ හෝ ඇයගේ නිසි බලයලත් නියෝජිතයකුගේ මාර්ගයෙන් හෝ එම අභියාචනය සලකා බලන අවස්ථාවේදී වීඩියෝ කොන්ෆරන්සින් පහසුකම තිබුනේනම් වීඩියෝ කොන්ෆරන්සින් ක්‍රමය ඔස්සේ කොමිෂන් සභාව ඉදිරියේ පෙනීසිටීමට අභියාචකයින්ට හා පොදු අධිකාරින්ට අවස්ථාව ලබාදෙනු ලැබිණ. එසේම 2023 වසරේ තුන්වන කාර්තුවේ සිට බස්නාහිර පළාතේ පොදු අධිකාරින් සඳහා කොමිෂන් සභාව ඉදිරියේ පෙනීසිටිමින් අභියාචනා විභාග කිරීමේ ක්‍රියාවලිය සිදු කිරීමට තීරණය කරන ලදී. මෙම හේතුව නිසා නැවත නැවත අභියාචනා කල් තැබීමකින් තොරව ඉක්මනින් තීන්දු ලබාදීමට හැකියාවක් ඇතිවිය.

2022,2023 වර්ෂයේ මෙන්ම 2024 වර්ෂයේද කොමිෂන් සභාව විසින් අභියාචනා විභාග අවසන්වූ විගස අවශ්‍යතාවය පරිදි ලිඛිත නියෝග ලබාදෙනු ලැබිණ. එසේ කටයුතු කිරීම කොමිෂන් සභාවේ කාර්යයන් කාර්‍යක්ෂම හා ඵලදායි ලෙස ඉටුකිරීමට ඉහළ දායකත්වයක් ලබාදුන් අතර කොමිෂන් සභාවේ තැපැල් වියදම පෙර වසරවලට වඩා අවම කරගැනීමට හැකිවිය.

**පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාවේ තිරණය ක්‍රියාත්මක නොකිරීම පිළිබඳ පරීක්ෂණ**

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39(1) අ,ආ,ඇ,ඉ වගන්ති ප්‍රකාරව වරදක් කරනු ලබන සෑම තැනැත්තෙකුටම එරෙහිව අපරාධ නඩු පැවරීමක් කොමිෂන් සභාව විසින් ආරම්භ කළ යුතුය. ඒ අනුව එසේ නඩු කටයුතු ආරම්භ කිරීමට පෙර කොමිෂන් සභාව විසින් කැඳවනු ලැබූ තීරණයට අනුකූල නොවීමේ පරීක්ෂණ වලට අදාළ විස්තර පහත පරිදි වේ.

වගුව 07 – 2024 වර්ෂයේ පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාවේ තිරණය ක්‍රියාත්මක නොකිරීම පිළිබඳ පරීක්ෂණ

| **අංක** | **අභියාචනා අංකය** | **පරීක්ෂණයේ අංකය** | **අභියාචකගේ නම** | **පොදු අධිකාරිය** | **වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|---|
| 1 | 197/2023 | 1/2024 | එන්.සිවසුතන් | කොළඹ නගර සභාව | අභියාචක ඉල්ලා ඇති තොරතුරු ප්‍රමාණවත් අයුරින් මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කර ඇත |

| අං ක | අභියාච නා අංකය | පරීක්ෂණ යේ අංකය | අභියාචකගේ නම | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| 2 | 372/2022 | 2/2024 | සුජිත් ප්‍රසන්න | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය- අම්බලන්තොට | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් පරිදි අභියාචක වෙත තොරතුරු සපයා ඇති බැවින් පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 3 | 876/2023 | 3/2024 | යූ.ඒ.ප්‍රිය ශාන්ත | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - මැදදුම්බර | පොදු අධිකාරිය අභියාචක හට ප්‍රමාණවත් අයුරින් තොරතුරු මුදාහැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 4 | 1086/2022 | 4/2024 | එච්.ඩී. ඩග්ලස් | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය- තංගල්ල | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් අයුරින් තොරතුරු මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි |
| 5 | 114/2022 | 5/2024 | ආර්.බී.ආර් අබේසේකර | කොළඹ නගර සභාව | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් පරිදි අභියාචක වෙත තොරතුරු සපයා ඇති බැවින් පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 6 | 124/2022 | 6/2024 | ඩී.එස්.විජේසූරිය | පළාත් සෞඛ්‍යය සේවා අධ්‍යක්ෂ කාර්යාලය- මහනුවර | පොදු අධිකාරිය විසින් අභියාචකට කොමිෂන් සභාව ඉදිරියේදී තොරතුරු ලබා දෙනු ලබයි. ලේඛන පරික්ෂා කර බලා අභියාචක සෑහිමකට පත් වන බැවින් පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කරන ලදි |
| 7 | 824/2022 | 7/2024 | ඩී.කේ.ඩී. විජයවීර | ශ්‍රී ලංකා රේගුව | අභියාචක සදහන් කරන චෝදනා විමරශණය කිරීමේ බලයක් නොමැති බැවින් ඒ සදහා නියමිත බල අධිකාරිය අභියාචක විසින් තෝරා ගත යුතු වේ.එබැවින් පරීක්ෂණය අවසන් කර ඇත. |
| 8 | 727/2021 | 8/2024 | එන්.ඒ.සී නිශ්ශංක | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් අයුරින් තොරතුරු මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි |

| අංක | අභියාචනා අංකය | පරීක්ෂණයේ අංකය | අභියාචකගේ නම | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| 9 | 1199/2022 | 9/2024 | බි.ඒ.බී.එස් ජයවර්ධන | කාර්මික සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් අයුරින් තොරතුරු මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 10 | 1420/2022 | 10/2024 | එස්.ඩබ්. තිලකරත්න | නගර සභාව-මහනුවර | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් අයුරින් තොරතුරු මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 11 | 389/2023 | 11/2024 | එස්.හදරාගම | කාන්තා ළමා සම්බන්දතා හා සමාජ සම්බන්ධතා සවිබල ගැන්විමේ අමාත්‍යාංශය | තොරතුරු සැපයීමට වන එකගතාවය මත පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කරන ලදි. |
| 12 | 1020/2022 | 12/2024 | ආර්.තෙනබදු | බුද්ධ ශාසන ආමාත්‍යාංශය | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් අයුරින් තොරතුරු මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි |
| 13 | 1063/2021 | 13/2024 | එස්.පී.එස් කුමාරසිරි | මෝටර් රථ දෙපාර්තමේන්තුව | තොරතුරු ප්‍රමාණවත් පරිදි සපයා ඇති බවට නිගමනය කරමින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 14 | 424/2023 | 14/2024 | Dr. මුදිත ලියනගේ | ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම | අභියාචක වෙත කොමිෂන් සභාව ඉදිරියේදී තොරතුරු බාර දෙන ලදි. අභියාචක සැහිමකට පත් වේ. ඒ අනුව පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 15 | 913/2022 | 15/2024 | නන්දනි කුමාරි | ජනතා රාජ්‍ය සංවර්ධන මණ්ඩලය | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් අයුරින් තොරතුරු මුදා හැර ඇති හෙයින් |

| අං ක | අභියාච නා අංකය | පරීක්ෂණ යේ අංකය | අභියාචකගේ නම | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| | | | | | පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 16 | 52/2021 | 16/2024 | එස්.ර්. ලිලාරත්න | සභා ලේකම් කායීාලය- දකුණු පළාත | පොදු අධිකාරිය විසින් ඉල්ලා සිටින ලද තොරතුරු ප්‍රමාණාත් අයුරින් ලබා දී ඇති හෙයින් පරීක්ෂ්ණය අවසන් කරන ලදි |
| 17 | 1178/2022 | 17/2024 | ඒ.ඒ.එම්.ආර්. අලි | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | අභියාචක තොරතුරු ලැබී ඇති බව සඳහන් කරමින් පැමිණිල්ල ඉල්ලා අස් කර ගත් හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 18 | 387/2023 | 18/2024 | එස්.හදරාගම | කාන්තා ළමා සම්බන්දතා හා සාමාජ සම්බන්ධතා සවිබල ගැන්විමේ අමාත්‍යාංශය | පොදු අධිකාරිය විසින් තොරතුරු සපයා ඇති බවට කරුණු ඉදිරිපත් කරයි. ඒ අනුව පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කරන ලදි. |
| 19 | 131/2023 | 19/2024 | අසිත අබේගුණව ර්ධන | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | කොමිෂන් සභාවේ තීරණයට පොදු අධිකාරිය අනුකූල වී ඇති බවට නිරීක්ෂණය වන බැවින් පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කරන ලදි |
| 20 | 1070/2022 | 20/2024 | ආර්.තෙනබදු | බෞද්ධ කටයුතු පිළිබද දෙපාර්තමේන්තුව | පොදු අධිකාරිය සතු තොරතුරු විනාශ වූ බව පොදු අධිකාරිය සනාථ කිරීම හේතුවෙන් 2016 අංක 12 දරණ පනතේ 39 (१) වගන්තිය යටහේ මහේස්ත්‍රත් අධිකරණ අධිකරණයේ නඩු පැවරීම සුදුසු නොවන බව කොමිෂන් සභාව තීරණය |

| අං ක | අභියාච නා අංකය | පරීක්ෂණ යේ අංකය | අභියාචකගේ නම | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| | | | | | කල හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි |
| 21 | 1070/2022 | 21/2024 | එම්.ඒ.එන් නලින් | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | අභියාචක විසින් තමා හට මෙම පරීක්ෂණය අවශ්‍ය නොවන බව දන්වා ඇත. ඒ අනුව පරීක්ෂණය අවසන් කොට ඇත. |
| 22 | 627/2021 | 22/2024 | ඩබ්.එස්.හේම කාන්ති | නගර සභාව- ගම්පහ | අභියාචක ඉල්ලා ඇති තොරතුරු ප්‍රමාණවත් අයුරින් මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කර ඇත |
| 23 | 581/2023 | 23/2024 | එස්.ඒ.උදය කුමාර | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | අභියාචකට තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය එකග වී ඇත. ඒ අනුව පරීක්ෂණය අවසන් කොට ඇත. |
| 24 | 1457/2022 | 24/2024 | ජී.ජී.සී.කිර්තිරත්න | තැපැල් දෙපාර්තමේන්තුව | අභියාචක විසින් ඉල්ලා සිටින ලද තොරතුරු ලැබී ඇති බවට දැනුම් දී ඇත. ඒ අනුව පරීක්ෂණය අවසන් කර ඇත. |
| 25 | 59/2023 | 25/2024 | ජී.ජී.සී.කිර්තිරත්න | විභාග දෙපාර්තමෙන්තුව | අභියාචක ඉල්ලා ඇති තොරතුරු ප්‍රමාණවත් අයුරින් මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කර ඇත. |
| 26 | 747/2023 | 26/2024 | සී.එල් රෝද්‍රගු | පළාත් පාලන දෙපාර්තමේන්තුව -සබරගමුව පළාත | අභියාචක ඉල්ලා ඇති තොරතුරු ප්‍රමාණවත් අයුරින් මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කර ඇත |
| 27 | 458/2023 | 27/2024 | කේ.ඩී මල්වනගේ | විභාග දෙපාර්තමේන්තුව | අභියාචක ඉල්ලා ඇති තොරතුරු ප්‍රමාණවත් අයුරින් |

| අංක | අභියාචනා අංකය | පරීක්ෂණයේ අංකය | අභියාචකගේ නම | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| | | | | | මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කර ඇත. |
| 28 | 774/2023 | 28/2024 | කේ.එස්. සිරිල් | ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් දෙපාර්තමේන්තුව-කොළඹ | අභියාචක ඉල්ලා ඇති තොරතුරු ප්‍රමාණවත් අයුරින් මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කර ඇත. |
| 29 | 717/2022 | 29/2024 | ඒ.ජේ. ගුණතිලක | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | පොදු අධිකාරිය විසින් අභියාචකට කොමිෂන් සභාව ඉදිරියේදී තොරතුරු ලබා දෙනු ලබයි. ලේඛන කොමිෂන් සභාව විසින් පරික්ෂා කර ප්‍රමාණවත් අයුරින් තොරතුරු සපයා ඇති බවට නිගමනය කරමින් පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කරන ලදි |
| 30 | 266/2023 | 30/2024 | එස්.එන්.පි. කුමාර | ප්‍රදේශිය සභා කුරුවිට | අභියාචක ඉල්ලා ඇති තොරතුරු ප්‍රමාණවත් අයුරින් මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කර ඇත. |
| 31 | 488/2023 | 31/2024 | එච්.එම්.පී. බණ්ඩාර | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් අයුරින් තොරතුරු ලබා දී ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 32 | 688/2022 | 32/2024 | එස්.ඩබ්ලිව්. තිලකරත්න | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | අභියාචක ඉල්ලා ඇති තොරතුරු ප්‍රමාණවත් අයුරින් මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කර ඇත. |
| 33 | 465/2023 | 33/2024 | බී.එල්.ඩී.ඩී. වසන්ත | නාගරික සංවර්ධන අධිකාරිය | අභියාචක ඉල්ලා ඇති තොරතුරු ප්‍රමාණවත් අයුරින් මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කර ඇත. |

| අංක | අභියාචනා අංකය | පරීක්ෂණයේ අංකය | අභියාචකගේ නම | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| 34 | 1280/2022 | 34/2024 | එස්.ඩී.එස්.පින්නදුවගේ | ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව | අභියාචක ඉල්ලා ඇති තොරතුරු ප්‍රමාණවත් අයුරින් මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කර ඇත. |
| 35 | 253/2023 | 35/2024 | එස්.එම්.එම්. ප්‍රසන්න | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 2024/06/28 වන දිනට ප්‍රථම අභියාචක වෙත තොරතුරු මුදා හැරීමට නියෝග කරමින් පරීක්ෂණය අවසන් කර ඇත |
| 36 | 592/2023 | 36/2024 | ඒ.එම්.එම්.ටී. බණ්ඩාර | මිනිපේ ප්‍රාදේශීය සභාව-හසලක | 2024/06/26 වන දිනට ප්‍රථම අභියාචක වෙත තොරතුරු මුදා හැරීමට නියෝග කරමින් පරීක්ෂණය අවසන් කර ඇත. |
| 37 | 1397/2022 | 37/2024 | කේ. සුමතිපාල | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව (ගොවිජන සේවා මධ්‍යස්ථානය - මිහින්තලේ) | අභියාචක ඉල්ලා ඇති තොරතුරු ප්‍රමාණවත් අයුරින් මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කර ඇත. |
| 38 | 311/2023 | 38/2024 | ඩී.කේ.ඩී. විජයවීර | ශ්‍රී ලංකා රේගුව | තොරතුරු ප්‍රමාණවත් අයුරින් ලැබී ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 39 | 93/2021 | 39/2024 | එම්.එස්. චමින්ද | ජාතික ලේඛනාගාර දෙපාර්තමේන්තුව | අභියාචක ඉල්ලා ඇති තොරතුරු ප්‍රමාණවත් අයුරින් මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කර ඇත. |
| 40 | 173/2023 | 40/2024 | එස්.එල් ගොනලගෝඩ | ශ්‍රී ලංකා පොලිසිය | අභියාචක ඉල්ලා ඇති තොරතුරු ප්‍රමාණවත් අයුරින් මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කර ඇත. |
| 41 | 174/2023 | 41/2024 | එස්.එල් ගොනලගෝඩ | ශ්‍රී ලංකා පොලිසිය | අභියාචක ඉල්ලා ඇති තොරතුරු ප්‍රමාණවත් අයුරින් මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කර ඇත. |

| අං ක | අභියාච නා අංකය | පරීක්ෂණ යේ අංකය | අභියාචකගේ නම | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| 42 | 552/2023 | 42/2024 | තරිඳු ජයවර්ධන | ජනාධිපති ලේකම් කාර්යාලය | අභියාචකගේ තොරතුරු ඉල්ලීමෙහි අයිතම අංක 7 අදාළ ලේඛණ පොදු අධිකාරිය සතුව නොමැති බව අභියාචක පිළිගත් බැවින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 43 | 131/2021 | 43/2024 | ඒ.එම්.ජසීල් | ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය | පොදු අධිකාරිය තොරතුරු මුදා හැරීමක් සිදු කර ඇත. කොමිෂන් සභාව විසින් එම තොරතුරු පරීක්ෂාකර බලන ලද අතර අභියාචකගේ විරෝධතාවයක් දක්වා නොමැති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 44 | 1063/2023 | 44/2024 | ඒ.චන්දන | දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාව | පොදු අධිකාරිය කොමිෂන් සභාවේ තීරණයට අනුකූල වීම පැහැර හැර ඇති බවට තීරණය කරමු. ඒ අනුව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වන වගන්තිය යටතේ පොදු අධිකාරියට එරෙහිව නඩු කටයුතු ආරම්භ කිරීමට තීරණය කර ඇත. |
| 45 | 1064/2023 | 45/2024 | පද්මිණී කීර්තිලතා | දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාව | පොදු අධිකාරිය කොමිෂන් සභාවේ තීරණයට අනුකූල වීම පැහැර හැර ඇති බවට තීරණය කරමු. ඒ අනුව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වන වගන්තිය යටතේ පොදු අධිකාරියට එරෙහිව නඩු කටයුතු ආරම්භ කිරීමට තීරණය කර ඇත. |

| අංක | අභියාචනා අංකය | පරීක්ෂණයේ අංකය | අභියාචකගේ නම | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| 46 | 641/2022 | 46/2024 | ඊ. චන්ද්‍රකුමාර | අභ්‍යන්තර කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය | අභියාචක ඉල්ලා ඇති තොරතුරු ප්‍රමාණවත් අයුරින් මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කර ඇත |
| 47 | 1687/19 | 47/2024 | ඊ. චන්ද්‍රකුමාර | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - අම්පාර | අභියාචක විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කල ලේඛන අනුව පරීක්ෂණය ඉදිරියට පවත්වා ගෙන යා නොහැකි බැවින් පරීක්ෂණය අවසන් කරන ලදි |
| 48 | 1688/19 | 48/2024 | ඊ. චන්ද්‍රකුමාර | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - අම්පාර | අභියාචක විසින් නව තොරතුරු ඉල්ලීමක් ඉදිරිපත් නොකළ හෙයින් ඒ සම්බන්ධව පොදු අධිකාරියට වගකීමක් පැවරිය නොහැකි අතර එහෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 49 | 722/2023 | 49/2024 | එස්.එච් සුමතිපාල | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - බදුල්ල | අභියාචක විසින් ඉල්ලා සිටින ලද තොරතුරු පොදු අධිකාරිය ලබා දීමට එකග වූ හෙයින් අභියාචක විසින් අභියාචනය ඉදිරියට පවත්වාගෙන යාමට අදහස් නොකරන බව ලිපියකින් දැන්වූ බැවින් පරීක්ෂණය අවසන් කරන ලදි |
| 50 | 916/2023 | 50/2024 | එච්.ඩී.බී ජයසිංහ | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - කරන්දෙනිය | පොදු අධිකාරිය කොමිෂන් සභාවේ තීරණයට අනුකූල වීම පැහැර හැර ඇති බවට තීරණය කරමු. ඒ අනුව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වන වගන්තිය යටතේ පොදු අධිකාරියට එරෙහිව නඩු කටයුතු ආරම්භ කිරීමට තීරණය කර ඇත. |

| අං ක | අභියාච නා අංකය | පරීක්ෂණ යේ අංකය | අභියාචකගේ නම | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| 51 | 680/2023 | 51/2024 | ටී. එමිල් නිරෝෂන් | පළාත් පාලන දෙපාර්තමේන්තුව (EP) | පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාවේ තීරණයට අනුකූල වී නොමැති බවට ප්‍රමානවත් කරුණු දැක්වීමක් අභියාචක විසින් සිදු කර නොමැති බවට කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. ඒ අනුව පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 52 | 105/2023 | 52/2024 | එස්.ඒ.ඒ සමරක්කොඩි | පළාත් පාලන දෙපාර්තමේන්තුව-සබරගමුව පළාත. | අභියාචක විසින් ඉල්ලා සිටින ලද තොරතුරු ලැබී ඇති බවට දැනුම් දී ඇත. ඒ අනුව පරීක්ෂණය අවසන් කර ඇත. |
| 53 | 1323/2022 | 53/2024 | ඩී.එච් මහලියන | ගාල්ල ගගබඩපත්තුව දකුණ කුඩා තේ වතු හිමියන්ගේ සමූපකාර සමිතිය, මහහේන, බද්දේගම | තොරතුරු ප්‍රමණවත් අයුරින් සපයා ඇති බැවින් පරීක්ශණය අවසන් කර ඇත |
| 54 | 1046/2022 | 54/2024 | ආර්.එම්.එම්. පී. රාජපක්ෂ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව-පේරාදෙණිය | අභියාචකගේ දිවුරුම් ප්‍රකාශයට අනුව තොරතුරු ලබාගත යුත්තේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් හේතුවෙන් 2016 අංක 12 දරණ පනතේ 39(ඉ) වගන්තිය යටතේ පොදු අධිකාරියට එරෙහිව ක්‍රියා කිරීමට හේතු සාධක නොමැති හෙයින් ද අභියාචගේ දිවුරුම් ප්‍රකාශය මගින් 39 (ඉ) වගන්තියේ කරුණු අණාවරණය නොවන බැවින් පරීක්ෂණය කරන ලදි. |

| අංක | අභියාචනා අංකය | පරීක්ෂණයේ අංකය | අභියාචකගේ නම | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| 55 | 315/2023 | 55/2024 | පී.බී. සිරිසේන | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | අභියාචක විසින් පොදු අධිකාරිය ප්‍රමාණවත් අයුරින් තොරතුරු ලබා දී ඇති බව ලිපියක් මගින් දැන්වූ හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 56 | 1295/2023 | 56/2024 | එන්.පී. උබයසේකර | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | පොදු අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද කරුණු කොමිෂන් සභාව විසින් සලකා බලන ලද අතර කොමිෂන් සභාවේ තීරණය පරිදි ක්‍රියා කර ඇති බව කොමිෂන් සභාව තීරණය කර ඇත. එහෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි |
| 57 | 662/2023 | 57/2024 | ආර්.ඒ.ආර්. කේ. රණසිංහ | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - බස්නාහිර පළාත (දිස්ත්‍රික් මහ රෝහල හොරණ) | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් අයුරින් තොරතුරු මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 58 | 1436/2022 | 58/2024 | ජේ.අයි.අනුර කුමාර | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | අභියාචක විසින් ඉල්ලා සිටින ලද තොරතුරු පොදු අධිකාරිය භාරයේ නොමැති බව සනාථ කිරීම හේතුවෙන් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 59 | 156/2024 | 59/2024 | ඒ.කේ.සී.කේ .පී.ද සිල්වා | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- අනුරාධපුර | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් අයුරින් තොරතුරු මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 60 | 1033/2023 | 60/2024 | කේ.කේ. බුලත්සිංහල | පළාත් පාලන දෙපාර්තමේන්තුව – බස්නාහිර පළාත | අභියාචක විසින් පොදු අධිකාරිය ප්‍රමාණවත් අයුරින් තොරතුරු ලබා දී ඇති බව |

| අං ක | අභියාච නා අංකය | පරීක්ෂණ යේ අංකය | අභියාචකගේ නම | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| | | | | | දැන්වූ හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 61 | 398/2024 | 61/2024 | ආර්.එස්. හෙට්ටිආච්චි | ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය | අභියාචක විසින් ඉල්ලා සිටින ලද තොරතුරු ලැබී ඇති බවට දැනුම් දී ඇත. ඒ අනුව පරීක්ෂණය අවසන් කර ඇත. |
| 62 | 448/2023 | 62/2024 | එම්.එම්.එම්. සහිඩ් | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - අලයඩිවෙම්බු | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් අයුරින් තොරතුරු මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 63 | 719/2021 | 63/2024 | ඩී.ජී.කේ. දිල්රුක්ෂි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-රත්මලාන | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් අයුරින් තොරතුරු මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 64 | 1372/2023 | 64/2024 | කාර්තිකේසු වර්තිලිංගම් | මහජන බැංකුව | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් අයුරින් තොරතුරු මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 65 | 836/2023 | 65/2024 | ඒ.ඩී.කේ.ටී. යූ. සෙනරත් | අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය (සබරගමුව පළාත) | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් අයුරින් තොරතුරු මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 66 | 1161/2023 | 66/2024 | යූ.එම්.එච්.බී. හේවාවිස්ස | මහනුවර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් අයුරින් තොරතුරු මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි |

| අං ක | අභියාච නා අංකය | පරීක්ෂණ යේ අංකය | අභියාචකගේ නම | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| 67 | 1686/2019 | 67/2024 | චන්ද්‍රකුමාර් | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - අම්පාර | පොදු අධිකාරිය විසින් අදාළ තොරතුරු අභියාචක වෙත මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 68 | 923/2023 | 68/2024 | එම්. සදාර්දීන් | සේවක භාර අරමුදල් මණ්ඩලය | පොදු අධිකාරිය විසින් අදාළ තොරතුරු අභියාචක වෙත මුදා හැර ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 69 | 1637/2023 | 69/2024 | පී.එස්.සී.කේ. ඩී. සිල්වා | සෞඛ්‍ය අමාත්‍යාංශය | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් පරිදි තොරතුරු ලබා දී ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 70 | 282/2023 | 70/2024 | එස්.ඒ.ඩී.පී. වසන්ති ජයවර්ධන | ශ්‍රී ලංකා පොලිස් මූලස්ථානය | කොමිෂන් සභාව ඉදිරියට තොරතුරු රැගෙන විත් ඇත. තොරතුරු මුදාහැරීමට පොදු අධිකාරිය භාර ගනී. ඒ අනුව අභියාචකගේද එකගත්වය මත පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 71 | 1633/2023 | 71/2024 | සමන් හදරාගම | ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය | අභියාචක හට පොදු අධිකාරිය විසින් පෙරදී ලබා නොදුන් තොරතුරු පරීක්ෂණ දිනයේදී ගෙනැවිත් තිබුනද එහි සත්‍යතාව තහවුරු කර නොමැති හෙයින් එහි සත්‍යතාව තහවුරු කර නැවත ලබා අභියාචක හට ලබා දීමට තීරණය කල අතර ඒ අනුව පරීක්ෂණය අවසන් කරන ලදි. |

| අංක | අභියාචනා අංකය | පරීක්ෂණයේ අංකය | අභියාචකගේ නම | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| 72 | 1683/2024 | 72/2024 | ආර්.බී.ජේ. සුරංග | කම්කරු දෙපාර්තමේන්තුව | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් අයුරින් තොරතුරු සපයා ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදී. |
| 73 | 1542/2023 | 73/2024 | එච්.සුජාතා | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් අයුරින් තොරතුරු සපයා ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදී. |
| 74 | 279/2023 | 74/2024 | සී.කේ. ජයසේකර | කොළඹ මහ නගර සභාව | පොදු අධිකාරිය කොමිෂන් සභාවේ තීරණයට අනුකූල වීම පැහැර හැරීම හේතුවෙන් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට තීරණය කරමින් පරීක්ෂණය අවසන් කරන ලදී. |
| 75 | 656/2023 | 75/2024 | කේ.ඒ.පී. රංගන කුරුවිට | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් අයුරින් තොරතුරු සපයා ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදී. |
| 76 | 914/2024 | 76/2024 | එන්.ඒ. ජයවික්‍රම | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් අයුරින් තොරතුරු සපයා ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදී. |
| 77 | 253/2024 | 77/2024 | කේ.එම්.වී. ජේ. ප්‍රියන්ජිත් | මධ්‍යම පරිසර අධිකාරිය | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් අයුරින් තොරතුරු සපයා ඇති හෙයින් පරීක්ෂණය අවසන් කරන ලදී. |
| 78 | 1681/2023 | 78/2024 | ඒ.සයිරාම් | ශ්‍රී ලංකා ආයුර්වේද දෙපාර්තමේන්තුව | පොදු අධිකාරිය විසින් අභියාචක විසින් ඉල්ලා සිටින තොරතුරු 2024.11.28 දිනට පෙර ලබා දීමට එකඟ වූ |

| අංක | අභියාචනා අංකය | පරීක්ෂණයේ අංකය | අභියාචකගේ නම | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| | | | | | බැවින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 79 | 197/2024 | 79/2024 | අයි.එම්. ෆර්ෂාත් | මහ නගර සභාව – කල්මුනේ | තොරතුරු අස්ථානගත වීම පිළිබඳව පරීක්ෂණයක් පවත්වාගෙන යන බැවින් ප්‍රගතිය වාර්තා කිරීමට පොදු අධිකාරිය දින පතා ඇත. නැවත පරීක්ෂණය 31.01.2025 |
| 80 | 235/2024 | 80/2024 | අයි.එම්. ෆර්ෂාත් | මහ නගර සභාව – කල්මුනේ | තොරතුරු අස්ථානගත වීම පිළිබඳව පරීක්ෂණයක් පවත්වාගෙන යන බැවින් ප්‍රගතිය වාර්තා කිරීමට පොදු අධිකාරිය දින පතා ඇත. නැවත පරීක්ෂණය 31.01.2025 |
